# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2380/30 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල.


1A - G 41786 — 34 (2024/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය II

### වාරියපොල නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය පුළුල් කර ප්‍රකාශයට පත් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1002/10 හා 1997.11.18 *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් වාරියපොල නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ ප්‍රදේශය වන අංක 1239 විලාකටුපොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටස, අංක 1245 වාරියපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටස. අංක 1247 රත්මලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටස. අංක 1240 හොරොම්බුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටස හැර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි වාරියපොළ හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් වන්නා වූ. ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 1236 පානව. අංක 1212 මහකෙළිය. අංක 1202 හංහමුණුව, අංක 1207 බෝගොඩ. අංක 1214 නාථගනේ. අංක 1232 මුණමලේ, අංක 1233 බමුණාකොටුව. අංක 1216 කඩිහාර, අංක 1213 කෙළිමුණේ . අංක 1215 වල්පොල, අංක 1238 පහල ඉමියන්ගොඩ. අංක 1237 වේරපොල. අංක 1241 ඇඹව. අංක 1244 රන්දෙණිය. අංක 1235 මල්වාන අංක 1260 මැදගම, අංක 1243 වැව ගෙදර. අංක 1242 එලවිටිගම, අංක 1248 පියුම්ගල්ල.අංක 1269 මඩාටුව. අංක 1281 වැරැල්ල. අංක 1267 මඟුලාගම, අංක 1270 මාමුණුව. අංක 1246 ගිණිපෙන්දේගම. අංක 1268 පාදෙණිය. අංක 1240 හොරොම්බුව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ ඉතිරි කොටස. අංක 1239 විලාකටුපොත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉතිරි කොටස අංක 1245 වාරියපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉතිරි කොටස . අංක 1247 රත්මලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉතිරි කොටස යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලින් සමන්විත වූ II වැනි තීරුවේ විස්තර වන ඉම් හා මායිම වලින් යුක්ත වන්නා වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 1267 මගුලාගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු හා බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී එම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර. ගිණිකොණ නැවතත් නැගෙනහිර, උතුරු. වයඹ හා නැගෙනහිර දෙසට ගමන් කර අංක 1281 වැරැල්ල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු නැගෙනහිර නැවතත් උතුරු ඊශාන හා ගිනිකොණ හා නැගෙනහිර (අනුරාධපුර පාදෙණිය මාර්ගය ඡේදනය කරමින්) ගිණිකොණ දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද.

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1281 වැරැල්ල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණ, නැගෙනහිර. දකුණ. නැගෙනහිර නැවතත් දකුණු දෙසට ගමන් කර අංක 1268 පාදෙණිය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද. (වේපත්අංග මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්) එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු හා නිරිත දෙසට ගමන් කර අංක 1270 මාමුණුව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ, ඊශාන නැවතත් ගිණිකොණ හා නිරිත දෙසට ගමන් කර අංක 1247 රත්මලේ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ දෙසට ගමන් කර අංක 1248 පියුම්ගල්ල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර අංක 1242 එලවිටිගම ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන නැගෙනහිර හා ගිණිකොණ දෙසට ගමන් කර අංක 1243 වැවගෙදර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ දෙසට ගමන් කර වාරියපොල - ගනේවත්ත මාර්ගය ඡේදනය කරමින් අංක 1244 රංදෙණිය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, (මඟුරු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ) එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර අංක 1213 කෙළිමුණේ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ දෙසට ගමන් කර (මඟුරු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ) අංක 1202 හංහමුණුව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර කුරුණෑගල - පුත්තලම මාර්ගය ඡේදනය කරමින් එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද,

උපලේඛනය II *(සම්බන්ධිතයි)*

*දකුණට* :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1202 හංමුණුව ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත හා වයඹ දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු හා ඊශාන දෙසට ගමන් කර (හංහමුණුව උහුම්ය. දම්පිටිය මාර්ගය මධ්‍ය රේඛාව හමුවන තෙක්) නැවතත් එම මායිම ඔස්සේ ඊශාන හා වයඹ දෙසට (නාථගනේ මාර්ග යේ මධ්‍ය රේඛාව ඔස්සේ) ගමන් කර අංක 1207 බෝගොඩ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර හා උතුරු දෙසට ගමන් කර අංක 1214 නාථගනේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ. බටහිර. වයඹ නැවතත් බටහිර දෙසට ගමන් කර අංක 1216 කඩිහාරේ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු හා නිරිත දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර, වයඹ. නැවතත් බටහිර, ගිණිකොණ (කළුගමුව වාරියපොල මාර්ගය ඡේදනය කරමින්) හා නිරිත දෙසට ගමන් කර අංක 1232 මුණමලේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර. නිරිත. උතුරු හා නිරිත දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද.

*බටහිරට* :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 1232 මුණමලේ ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 1233 බමුණකොටුව ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ මහකෙළිය - කටුපොත මාර්ගය ඡේදනය කරමින් උතුරු. බටහිර. උතුරු නැගෙනහිර හා උතුරු දෙසට ගමන් කර (නාවින්න මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ) එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර අංක 1236 පානව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු හා වයඹ දෙසට ගමන් කර අංක 1235 මල්වාන ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට නාවින්න මාර්ගය ඡේදනය කරමින් එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු හා වයඹ දෙසට ගමන් කර අංක 1260 මැදගම ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට රඹාවැව - කඩහපොල මාර්ගය ඡේදනය කරමින් එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර (හලාවත - වාරියපොල මාර්ගය මධ්‍ය රේඛාව හමුවන තෙක්) නැවතත් එම මායිම ඔස්සේ බටහිර දෙසට (මීරිහානේගම - රඹාවැව මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්) ගමන් කර නැවතත් උතුරු දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර, උතුර. නැවතත් නැගෙනහිර, දකුණ, නැගෙනහිර දෙසට ගමන් කර අංක 1246 ගිණිපෙන්ද ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ

උපලේඛනය II *(සම්බන්ධිතයි)*

උතුරු දෙසට ගමන් කර අංක 1268 පාදෙණිය ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, (ගල්වැව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ) එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන හා උතුරු දෙසට ගමන් කර අංක 1269 මඩාටුව ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙන්ද. එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර, දකුණු, වයඹ, (ගල්වැව මාර්ගය ඡේදනය කරමින්) නිරිත දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු, ඊශාන, වයඹ, බටහිර, නැවතත් උතුරු හා ඊශාන දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර අංක 1267 මඟුලාගම ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද. එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන, නැගෙනහිර (කුරුණෑගල - පුත්තලම මාර්ගය ඡේදනය කරමින්) උතුර වයඹ. ඊශාන වයඹ හා උතුරු දෙසට ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

EOG 04 - 0157

---

## 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල.

### උපලේඛනය

### හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය පුළුල් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1025/09 දරන 1998.04.29 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කළ ප්‍රදේශයන්ට අමතරව. වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හලාවත හා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් වන්නා වූ ග්‍රාම

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 579බී දැඳුරු ඔය ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී එම වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ. නිරිත.

**උපලේඛනය II** *(සම්බන්ධිතයි)*

නිලධාරි කොට්ඨාස අංක 562 අඹකදවිල, අංක 547සී අතුවන. අංක 550සී දඹකැලේ, අංක 579බී දැදුරු ඔය. අංක 557ඒ දෙමටපිටිය. අංක 535ඒ එගොඩයාගම අංක 534ඩී එරුන්විල, අංක 534සී ගලහිටියාව, අංක 544 ගල්මුරුව උතුර. අංක 542ඒ ගල්මුරුව දකුණ. අංක 554ඒ හරීන්ද්‍රගම, අංක 551ඒ හින්අගාර. අංක 542 හේනපොල, අංක 558ඒ ඉහළ ඔළිදළුව, අංක 536 ඉහළගම. අංක 565 ඉලිප්පදෙනිය, අංක 557ඩී ඉදිගස්විල. අංක 566සී ඉනිගොඩවෙල. අංක 534 ඉරට්ටකුලම උතුර අංක 534බී ඉරට්ටකුලම දකුණ. අංක 544ඒ කච්චකඩුව අංක 561 කාක්කපල්ලිය, අංක 564 කරවිට. අංක 550ඒ කරවිටාගාර නැගෙනහිර. අංක 550 කරවිටාගාර බටහිර, අංක 554 කරුක්කුව, අංක 552 කරුක්කුවටවන, අංක 549 කොක්කාවිල. අංක 547බී කෝන්ගස්යාය. අංක 546 කුඩා බිංගිරිය. අංක 543 කුඩිරිප්පුව. අංක 537ඒ මහබද්දේගම. අංක 547ඒ මහගම උතුර අංක 547 මහගම දකුණ. අංක 566බී මයික්කුලම. අංක 556බී මනක්කුලම. අංක 569බී මානුවන්ගම බටහිර. අංක 558 මරදන්කුලම. අංක 537 මරක්කලගම, අංක 546ඒ මැදගම. අංක 533ඒ මැල්ලවාගාර අංක 566 මැරවල අංක 569 මුගුණුවටවන 02. අංක 564බී මුන්ගන්දළුව නැගෙනහිර. අංක 564ඒ මුන්ගන්දළුව බටහිර, අංක 568 මුන්නේෂ්වරම. අංක 535 පට්ටියගම. 555 පොන්නන්කන්නිය, අංක 540ඒ පූකුලම, අංක 534ඒ පොතුවිල අංක 548ඒ පුලියන්කඩවර. අංක 548 පුංචි විලත්තව, අංක 545ඒ රත්මල්ලාගාර. අංක 540 නෙලුම්පොකුණ. අංක 563 ඔලිදව අංක 560 පම්බල අංක 560 ඒ පම්බල දකුණු. අංක 545 නාන්කඩවර. අංක 543 ඒ පල්ලේකැලේ. අංක 546බී පනිරෙන්ඩාව. අංක 545බී රත්නගිරිය. අංක 566ඒ සවරාන, අංක 553 සෙම්බුකට්ටය, අංක 541ඒ සුදුවැල්ල අංක 557 තඹගල්ල, අංක 557බී තඹගල්ල වත්ත. අංක 557සී තඹගල්ල බටහිර, අංක 540බී තනිවැල්ලේගම, අංක 579 නිඹිල්ල. අංක 568 ඒ තිස්සෝගම, අංක 567 තිත්තකඩේ. අංක 551 උඟුරලිය, අංක 533 උඟුරලියාගාර. අංක 556ඒ වාලහේන, අංක 550බී වීරකැලේ වත්ත, අංක 562ඒ වැලිහේන. අංක 541 මුගුණුවටවන 01 යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත වූ ii තීරුවේ විස්තර වන ඉම් සහ මායිම වලින් යුක්ත වූ මුළු මහත් ප්‍රදේශය.

නැගෙනහිර දෙසට ගමන් කර (දැදුරු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ) අංක 568ඒ තිස්සෝගම ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා නැගෙ නහිර දෙසට ගමන් කර අංක. 569බී මානුවන්ගම බටහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊසාන, වයඹ නැවතත් ඊසාන දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමු වන තෙක් ද, එතැන් සිට එම වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ හා නිරිත දෙසට ගමන් කර අංක 568ඒ තිස්සෝගම ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර අංක 567 තිත්තකඩේ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර, ඊසාන නැවතත් නැගෙනහිර දෙසට ගමන් කර අංක 569 මුගුණුවටවන 02 ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක් ද. එතැන් සිට එම මායිම ඔස්සේ ඊසාන. නැගෙනහිර නැවතත් ඊසාන හා ගිණිකොණ දෙසට ගමන් කර අංක 549 කොක්කාවිල ග්‍රාම නිලධාරි වසමේ බටහිර හා උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එම වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන හා නැගෙනහිර දෙසට ගමන් කර අංක 548ඒ පුලියන්කඩවර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊසාන දෙසට ගමන් කර අංක 548 පුංචි විලත්තව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊසාන හා නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද.

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 548 පුංචි විලත්තව ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර හලාවත - වාරියපොල ප්‍රධාන මාර්ගය ඡේදනය කරමින් අංක 547ඒ මහගම උතුර. අංක 547 මහගම දකුණ. අංක 546බී පනිරෙන්ඩාව. අංක 545ඒ රත්මල්ලාගාර, අංක 545බී රත්නගිරිය. අංක 545 නාන්කඩවර, අංක 544ඒ කච්චකඩුව. අංක 544 ගල්මුරුව උතුර යන ග්‍රාම නිලධාරි වසම්වල නැගෙනහිර මායිම ඔස්සේ ගමන් කර කුලියාපිටිය - මාදම්පේ ප්‍රධාන මාර්ගය ඡේදනය කරමින් අංක 542ඒ ගල්මුරුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක් ද.

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 542ඒ ගල්මුරුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත දෙසට ගමන් කර අංක 542 හේනපොල. අංක 541 මුගුණුවටවන 01. අංක 540 නෙලුම්පොකුණ. අංක 537ඒ මහබද්දේගම. අංක 537 මරක්කලගම යන ග්‍රාම නිලධාරී වසම්වල දකුණු මායිම ඔස්සේ (කරඹලන්ද ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ) අංක 537 මරක්කලගම ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක් ද.

**උපලේඛනය II** *(සම්බන්ධිතයි)*

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 537 මරක්කලගම, අංක 534 ඉරට්ටකුලම උතුර, අංක 561 කාක්කපල්ලිය යන ග්‍රාම නිලධාරී වසම්වල බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 562 අඹකඳවිල ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 562ඒ වැලිහේන ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර (හලාවත නගර සභා සීමාවේ දකුණු මායිම) එම වසමේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට අංක 566 මැරවල, අංක 566බී මයික්කුලම, අංක 568 මුන්නේශ්වරම, අංක 579ඒ තිඹිල්ල, අංක 579බී දැදුරු ඔය යන ග්‍රාම නිලධාරී වසම්වල බටහිර මායිම ඔස්සේ (හලාවත නගර සභාවේ නැගෙනහිර මායිම ඔස්සේ) උතුරු දෙසට ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

EOG 04 - 0158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.